සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2007 වර්ෂයේ ජනවාරි - මාර්තු කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදයන් වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,655 - 2010 මැයි මස 21 වැනි සිකුරාදා - 2010.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1108 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1118 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1123 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 මැයි මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 මැයි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා බස්නාහිර පළාත තුළ අදාළ අවම සුදුසුකම් ඇති ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| 02. අනු අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | මාසික වැටුප | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කම්කරු | 01 | 11,730 - 120 x 10 - 130 x 10-145 x 10-160 x 12 - 17,600 | අවම වශයෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජෙනරාල් විසින් අනුමත පාසලක 08 වන ශ්‍රේණිය/09 වසර සමත් විය යුතුය. |

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18 නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
(ii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
(iii) අයදුම්කරු බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
(iv) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය ශරීර තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
(vi) රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුය.
(vii) දැනටමත් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ එම තනතුරේ අනියම්, ආදේශක, දීමනා මත, කොන්ත්‍රාත් හෝ කුලී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය; විශ්‍රාම වැටුප් සහිතය;
(ii) වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ද දායක විය යුතුය;
(iii) පත්වීම අවු 03 ක පරිවාස කාලයට යටත් වන්නේය;
(iv) මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද රජය හෝ බස්නාහිර පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම සේවකයින් බැඳී සිටිය යුතුවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

01. විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අයෙකු තෝරා ගැනේ.
02. අයදුම් පත්‍රය සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.
(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය,
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මහතාගෙන් ලබා ගත යුතුය).

06. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

07. *අයදුම්පත් :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2010.06.14 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව, දොඩන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමක් හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

එල්. ඩී. අනුර රාජේන්ද්‍ර,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - දොඩන්ගොඩ.

2010 අප්‍රේල් මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දොඩන්ගොඩ.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව*

*..................................................................... තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමඟ :———.
    මුලකුරුවලින් හැඳින්වෙන නම :———.

02. තැපැල් ලිපිනය :———.

03. උපන් දිනය : වර්ෂය:———. මාසය:———. දිනය:———.

04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :———. මාස:———. දින:———.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :———.

06. විවාහක/අවිවාහක බව :———.

08. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේනම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යනවග :———.

09. අධ්‍යාපන සුදුසුකම් :———.
    (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න)

10. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර, එම පත්වීමේ ස්වභාවය :———
    (ස්ථිර/අනියම්/තාවකාලික)

11. පළපුරුද්ද සහ වෘත්තීය සුදුසුකම් :———.

මෙම අයදුම්පතේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

05-499

---

**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩුවී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාල අවම සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය පරිපාලක | 01 | 12,920 - 10 x 120 - 11 x 140 -10 x 210-10 x 290 - රු. 20,660 | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගය හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම සහ බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතනයක වසර 05ක සේවා කාලයක් සහිත ස්ථිර තනතුරක් දරන්නෙකු වීම හෝ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය වාණිජ අංක ගණිතය සහ සිංහල /දෙමළ භාෂාව අතුළුව විෂයයන් 05කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම<br><br>හෝ<br><br>පළාත් පාලන ආයතනයේ වසර 10කට නොඅඩු කාලයක් (අඛණ්ඩ) ස්ථිර සේවයේ යෙදී ඇත්නම් 8 වන පන්තිය සමත්වීම. |
| 02 | ඖෂධ සංයෝජක | 01 | රු. 12,470 - 130 x 10 - 145 x 10 -160 x 10 - 170 x 12- රු. 18,860 | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම<br><br>හෝ<br><br>ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාග යෙන් එකම වතාවකදී ගණිතය/සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.<br><br>සහ<br><br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජයේ ලියාපදිංචි බෙහෙත් ශාලාවක කිසියම් තනතුරක වසරකට නොඅඩු සේවා කාලයක පළපුරුද්ද ලබා තිබීම. |
| 03 | පුස්තකාල සහායක | 01 | රු. 11,730 - 120 x 10 - 130 x 10 -145 x 10 - 160 x 12- රු. 17,600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් කවර හෝ විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුය. |
| 04 | පොත් බැඳුම්කරු | 01 | රු. 12,470 - 130 x 10 - 145 x 10 -160 x 10 - 170 x 12- රු. 18,860 | අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම. |
| 05 | මුරකරු | 01 | රු. 11,730 - 120 x 10 - 130 x 10 -145 x 10 -160 x 12- රු. 17,600 | අටවන ශ්‍රේණිය සමත් විය යුතුය. |
| 06 | විදුලි කම්බිකරු | 01 | රු. 12,210 - 130 x 10 - 145 x 10 -160 x 10 - 170 x 12- රු. 18,600 | අවම වශයෙන් අටවන ශ්‍රේණිය සමත් විය යුතුය.<br>අදාල ක්ෂෙත්‍රය පිළිබඳ මාස 06ක පළපුරුද්දක් තිබිය යුතුය. |
| 07 | විදුලි කම්බිකරු සහායක | 01 | රු.11,730 - 120 x 10 - 130 x 10 -145 x 10 - 160 x 12- රු.17,600 | අවම වශයෙන් අටවන ශ්‍රේණිය සමත් විය යුතුය.<br>අදාල ක්ෂෙත්‍රය පිළිබඳ මාස 06ක පළපුරුද්දක් තිබිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 08 | සෞඛ්‍ය කම්කරු | 03 | -එම- | අධ්‍යාපන සුදුසුකම් අදාල නොවේ. |
| 09 | මාර්ග කම්කරු | 02 | -එම- | අවම වශයෙන් 05 වන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය. |

*02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අය සඳහා උපරිම වයස් සීමාව බලපවත්වන්නේ නැත.)
(ii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(iii) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් සනාථ විය යුතුය.)
(iv) පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි අයදුම්කරුවන් වෙනුවෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
(vii) රජයේ /පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
(viii) පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(ix) අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
(x) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 05ක සේවා කාලයක් තුළ පාලින්ද නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
(xi) පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන ආයතනයක රාජකාරි ආවරණය කරන්නේ නම් හෝ තනතුරට අදාල පළපුරුද්දක් හෝ පුහුණුවක් ලබා තිබේ නම් එය විශේෂ සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

03. *සේවා නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද රජය හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි සහ නියෝගවලටද, අනුකූලව ක්‍රියා කිරීමට සියළු සේවකයින් බැඳී සිටිය යුතුය.
(iv) සේවයට බැඳුණු භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05ක් තුල ලබාගත යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව ලිඛිත වෘත්තීය හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගැනේ.
(ii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල්පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
4. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ;
5. වෘත්තීය හෝ පලපුරුද්ද තිබේ නම් එම සහතික ;

(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් නම් අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉදිරිපත් කළ යුතුය.)

05. මූල්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර එවීම :

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2010.06.04 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය සතුවේ.

ඒ. එන්. පැලවත්ත,
ලේකම්,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

පාලින්ද නුවර ප්‍රාදේශීය සභාව

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ....................................... තනතුර සඳහා බඳවා ගැනීම*

01. මුලකුරු සමග නම :———————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :———————.

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———————.

04. ස්ථිර ලිපිනය :———————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :____________. විවාහක/අවිවාහක බව:———————.

06. උපන් දිනය: අවුරුද්ද :———————. මාසය:———————. දිනය:———————.
වයස අවුරුදු :———————. මාස:———————. දින:———————.

07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන් ද? යන වග:———————.

08. අධ්‍යාපන සුදුසුකම් :———————.

i. සමත්වූ වසර/ශ්‍රේණිය :———————.
ii. අ.පො.ස. (සා.පෙළ) විභාගය .:———————.
විභාග අංකය:———————. වර්ෂය :———————. මාසය:———————.
සමත්වූ විෂයයන්

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

09. වෘත්තීය සුදුසුකම්: (සහතික මගින් සනාථ කළ යුතුය.)

10. සේවා පළපුරුද්ද : ———————.

11. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? : ———————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ තෝරා ගැනීමෙන් පසුව ඒ බව හෙලි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

____________
අයදුම්කරුගේ අත්සන.

දිනය : ———————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

____________.
ආයතන ප්‍රධානියා.

05-567

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට හා දැනටමත් මෙම සභාවේ අනියම්/තාවකාලික හා ආදේශක සේවයේ නියුක්ත අයට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

*උපලේඛනය*

| | *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණ* | | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය පරිපාලක | 01 | 13,120 - 10 x 145 - 11 x 170 -10 x 240 10 x 320 - 22,040 (MN1-2006A) | (අ) | සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය/ වාණිජ අංක ගණිතය ස්වස්ථතාව හා ශාරීරික විද්‍යාව/සෞඛ්‍ය විද්‍යාව/විද්‍යාව ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 5කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් අ.පො.ස.(සා.පෙ.) විභාගය සමත්වී තිබීම. |
| | | | | | හෝ |
| | | | | (ආ) | සිංහල/දෙමළ ,ගණිතය/අංක ගණිතය, වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව හා ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.)විභාගයෙන් සාමාර්ථය ලබා සිටින පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නෙකු |
| | | | | | හෝ |
| | | | | (ඇ) | පළාත් පාලන ආයතනයක අවුරුදු 10කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වෙනි පංතිය සාමාර්ථය ලබා සිටීම. |
| 02 | කාර්යාල කාර්ය සහායක | 01 | 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 -12 x 160-17,600 (PL1-2006A) (12 වන වැටුප් පියවරේ සිට) | (අ) | අ.පො.ස. (සා.ප�ෙළ) විභාගය එකවරකදී කවර හෝ විෂයයන් හයකින් (06) සමත්වී තිබිය යුතුය. |

*අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.
(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක (තුනක) කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.
(iii) 2010.06.15 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ. මෙම සහනය ලැබෙන්නේ රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට පමණි)
(iv) දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා ලිඛිත පරීක්ෂණය රා.ප.ච. 15/90 ප්‍රකාර
   *(අ)* සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 01 1/2 ක ප්‍රශ්න පත්‍රයක්,
   *(ආ)* සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන පැය 01ක ප්‍රශ්න පත්‍රයක්,
   ලිඛිත පරීක්ෂණයක් මගින් තීරණය වන කුසලතාවය මත පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2. කාර්යාල කාර්ය සහායක සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතයි.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට යටත්ව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලටද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනයකට අදාළ ආඥාපනත්වල විධිවිධානවලටද, අගලවත්ත ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන ලද නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද ආකෘති පත්‍ර 2010.06.15 දිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, අගලවත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම්පස කෙළවරේ .................................... .සඳහා අයදුම්පත (තනතුරේ නම) යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලි එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ සහතික ;
4. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය.

අනුලා රෝහිණී පොතුවිල,
ලේකම්,

ප්‍රාදේශීය සභාව,
අගලවත්ත.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2010***
***........................................ තනතුර***

විභාග අංකය :
(කාර්යාල ප්‍රයෝජනය සඳහා)

01. i.i මුලකුරු සමග නම :——————.
i.ii මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

02. පෞද්ගලික ලිපිනය :——————.

03. උපන් දිනය :——————.
2010.06.15 දිනට වයස: අවු. :——————. මාස:——————. දින:——————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුවේ "x" සලකුණ යොදන්න)

ස්ත්‍රී ☐ පුරුෂ ☐

06. විවාහක සහ අවිවාහක බව :——————.

07. පුරවැසිභාවය :
(i) පරම්පරාවෙන් ද :——————.
(ii) ලියාපදිංචිවීමෙන් ද :——————.

08. අධ්‍යාපන සුදුසුකම් :
අ. පො. ස (සා. පෙළ) විභාගය :
විභාග අංකය :——————. වර්ෂය:——————. මාධ්‍ය :——————.

*සමත්වූ විෂයයන්* *ශ්‍රේණිය*

1.
2.
3.
4.
5.
6.
7.
8.
9.
10.

11. වෘත්තීය දැනුම හා කුසලතාවය පිළිබඳ විස්තර :——————.

14. සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර : ——————.

| *තනතුර* | *ආයතනය* | *සේවයේ නියුක්තව සිටි කාලය* |
|---|---|---|
| | | |

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරාගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත් කිරීමෙන් පසු අසත්‍ය බව වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා./මිය./මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. /නොකරමි

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය : ——————.

අත්සන : ——————.
නම: ——————.
පදවි නාමය: ——————.
දෙපාර්තමේන්තුව/ආයතනය: ——————.
දිනය: ——————.

05-545

## නාමල්ඔය ප්‍රාදේශීය සභාව

### නාමල්ඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තනතුරු පුරප්පාඩු

නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති නාමල්ඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු ගණන* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු II "ආ" | 01 | රු.12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 -12 x 170 - රු.18,860 (PL-3-2006) | *(අ)* අධ්‍යාපන අධ්‍යක්‍ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් අටවන ශ්‍රේණිය/නවය වසර සමත් වී සිටිය යුතුය.<br>*(ආ)* පෞද්ගලික කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.<br>*(ඇ)* අවම උස අඩි 5.0කි.<br>*(ඈ)* වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුයි. |
| 01 | මාර්ග කම්කරු III | 01 | රු.11,730 - 10 x 120 - 10 x 130- 10 x 145 -12 x 160 - රු. 17,600 | *(අ)* අවම වශයෙන් 5 ශ්‍රේණිය සමත්වීම |

03. *බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :*

01. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
02. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
03. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-45ත් අතර විය යුතුය. (එහෙත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
04. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයෙන් වූ වසර 03ක කාලයක් නාමල්ඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතුය.
05. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී හෝ රජයේ පළාත් රජයේ සේවයෙන් පහකරනු ලැබූ අයෙකු නොවිය යුතුය.
06. සභා සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්‍ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලැබේ. එහෙත් රියදුරු සේවය සඳහා බඳවා ගැනීමේදී ප්‍රායෝගික නිපුණතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ.
02. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
03. වැන්දඹු පුරුෂ හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් දායකත්වය සඳහා දායක මුදල් අයකෙරේ.
04. පත්වීම ලැබූ දින සිට අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
05. මෙයට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලටද වරින්වර නාමල්ඔය ප්‍රාදේශීය සභාව හෝ රාජය සේවා කොමිෂන් සභාව මගින් නිකුත් කරන නීති හා නියෝගවලට ද යටත් විය යුතුය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(1) මෙම නිවේදනයේ ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

(2) සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් ද සමග 2010.06.15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, නාමල්ඔය ප්‍රාදේශීය සභාව, පරගහකැලේ අම්පාර යන ලිපිනයට එවිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය,
*(ආ)* අධ්‍යාපන සහතික,
*(ඇ)* පදිංචිය සනාථ කිරීමට ප්‍රාදේශීය ලේකම් සහතික කළ ග්‍රාමනිලධාරි සහතිකය,
*(ඈ)* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ,
*(ඉ)* වෘත්තීය හෝ පළපුරුද්ද තිබේ නම් ඒ බව සනාථ කරන සහතික,

*සැළකිය යුතුයි :*

01. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය මත එවිය යුතුය.
02. අයදුම්පත සමග එවන සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ඒ. රණබාහු,
ලේකම්,
නාමල්ඔය ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 03 වැනි දින,
නාමල්ඔය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

**නාමල්ඔය ප්‍රාදේශීය සභාව**

**........................................................................ *තනතුර සඳහා අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :———.
02. මුලකුරු සමග නම :———.
03. ස්ථිර ලිපිනය :———.
04. උපන් දිනය :
    වර්ෂය:——— මාසය:——— දිනය:———.
05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
    අවු. :———. මාස:———. දින:———.
06. ජාතිය :———.
07. ආගම :———.
08. විවාහක/අවිවාහක බව :———.
09. ස්ත්‍රී/පුරුෂ භාවය :———.
10. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේනම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද යන වග :———.
11. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :———.
12. අධ්‍යාපන සුදුසුකම් :

    අ.පො.ස. (සා.පෙළ) :

| *විෂයයන්* | *සාමාර්ථ* | *විෂයයන්* | *සාමාර්ථ* |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4. | | 5.<br>6.<br>7.<br>8. | |

13. අ.පො.ස. (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලබා නොමැතිනම් ඔබ ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම :———.
14. වෙනත් සුදුසුකම් :———.
15. සේවා පළපුරුද්ද :———.
16. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලබා උසාවියකින් වරදකරුවෙකු වී තිබේ ද ? :———.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

*(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)*

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවත්, දැනට ............................. වශයෙන් සේවය කරන බවත්, සහතික කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

05-564

# පළාත් පාලන නිවේදන

## පෑලියගොඩ නගර සභාව

### 2010 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

පෑලියගොඩ නගර සභාව විසින් 2009 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 4-1 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත වී ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2010 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, එක් එක් වාරිකය අයත් 2010 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දිනට පෙර පෑලියගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කිසියම් වරිපනම් බදු ගෙවන්නකු විසින් නියමිත කාලය ඉකුත්වීමට මත්තෙන් ඒ වරිපනම් ගෙවීමට අපොහොසත්වන්නේ නම්, අදාල වරිපනම් ගෙවන්නාගේ දේපල තහනමට ගැනීමට නගර සභා ආඥාපනත යටතේ ක්‍රියා කිරීමට සිදුවන බව වැඩිදුරටත් නිවේදනය කරමි.

ඩී. නිහාල් ආනන්ද පෙරේරා,
සභාපති,
පෑලියගොඩ නගර සභාව.

2009 ඔක්තෝබර් මස 01 වැනි දින,
පෑලියගොඩ නගර සභාව,
පෑලියගොඩ.

#### උපලේඛනය

4-0 *යෝජනා ඉදිරිපත් කිරීම*
*4-1 ගරු සභාපති ඩී. නිහාල් ආනන්ද පෙරේරා මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා :*

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 166 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 238 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් නගර සභා වෙත කරන ලද නියමය ප්‍රකාර, පෑලියගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගෙවල්වල ගොඩනැගිලිවල සියලුම ඉඩම්වල හෝ ගෙපත්වල 2009 වර්ෂයට අදාල වාර්ෂික තක්සේරු වටිනාකම් 2010 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පෑලියගොඩ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී දේපල මත ඉහත කී වාර්ෂික තක්සේරු වටිනාකමින් -

*(අ)* නේවාසික ස්ථාන සඳහා සියයට එකොළහක (11%) ප්‍රතිශතයක් යටතේ ද;
*(ආ)* වෙළඳ හෝ වාණිජ කාර්යස්ථාන සඳහා සියයට දහහතරක (14%) ප්‍රතිශතයක් යටතේ ද,

2010 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට සැප්තැම්බර් මස 31 වැනි දින තෙක් වන කාලය සඳහා වරිපනම් නියම කිරීමටත්, සහ එකී වරිපනම් 2010 මාර්තු 31, ජුනි 30 , සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන එක් එක් කාර්තුවට අදාලව වාරික හතරකින් පෑලියගොඩ නගර සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු බවත්,

2010 වර්ෂය සඳහා ගෙවිය යුතු වාර්ෂික වරිපනම්, යම් වරිපනම් ගෙවන්නකු විසින් 2010 වර්ෂයේ ජනවාරි 31 වැනි දින හෝ එදිනට පෙර පෑලියගොඩ නගර සභාවට ගෙවනු ලබන අවස්ථාවක එම වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී වාර්ෂික වරිපනම් වාරික මගින් ගෙවනු ලබන අවස්ථාවක දී අදාල කාර්තුවේ මුල් මාසය අවසන් වීමට මත්තෙන් ගෙවනු ලබන අවස්ථාවක එම වරිපනම් වාරිකයෙන් සියයට පහක (5%) වට්ටමක් ද, එකී වරිපනම් ගෙවන්නා වෙත ලබාදිය යුතු බවට නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තියේ (v) වැනි උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987.04.10 දිනැති අංක 261 දරන *ගැසට් පත්‍රයෙන්* නගර සභාවට කරන ලද නියමය අනුව සම්මත කළ යුතු බවටත් පෑලියගොඩ නගර සභාව යෝජනා කරන්නීය.

05-452/1

---

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ, අංක 122 හා 126 දරන වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල ප්‍රකාරව, 1952 අංක 06 පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙන් පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව අංක 520/07 හා 1988.08.23 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 1989 අංක 12 දරන පළාත් පාලන (අනුශාංගික විධිවිධාන) පනතේ 2(3) වගන්තිය අනුව දකුණු පළාතේ පළාත් සභාව විසින් පිළිගත් බවට අංක 648 හා 1991.02.01 දින දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ ප්‍රකාශිත වූ ද

සම්මත අතුරු ව්‍යවස්ථාවල අංක 21 "අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම" අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනය සඳහා පහත උපලේඛනයේ දැක්වෙන වෙළඳාම් ඇතුළත් කොට පිළිගැනීම සඳහාත් 2009 දෙසැම්බර් 22 දිනැති 23 සභාව විසින් මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට වලංගු වන පරිදි යෝජනා අංක 7(2) මගින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. කපිල,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

01. මෝටර් රථ අළුත්වැඩියා කිරීම
02. ලී මෝලක් පවත්වාගෙන යාම
03. රන් රිදී ලෝහ ආලේපනය කිරීම
04. බැටරි චාජ් කිරීම
05. වායු සමීකරණ, ශීතකරණ අළුත්වැඩියා කිරීම
06. ෆයිබර්ග්ලාස් භාණ්ඩ නිෂ්පාදනය
07. පොහොර වෙළඳාම
08. කෘෂි රසායන ද්‍රව්‍ය වෙළඳාම
09. රබර් රෝලක් සහිත දුම්ගෙයක් පැවැත්වීම
10. පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම
11. කුරුඳු බොයිලේරුවක් පවත්වාගෙන යාම
12. කම්මලක් පවත්වාගෙන යාම
13. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය
14. හඳුන්කූරු නිෂ්පාදනය

05-573/9

---

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

ඉඩම් විකිණීම මත බදු අයකිරීම

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවකුගෙන් හෝ තැරැව්කරුවකුගෙන් හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක හෝ ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1%කට සමාන බද්දක් ගැණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් එම ඉඩමෙන් ලත් මුදලින් මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කේ. ජී. කපිල,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

05-573/7

---

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

2010 වර්ෂය සඳහා වරිපනම් බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාර සැලසී ඇති විධිවිධාන පරිදි මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති ප්‍රදේශ ඇතුළත පිහිටායා වූ සියළු නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් 6% ක දේපළ බද්දක් පිළිවෙලින් 2010 මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් අයවිය යුතු අන්දමට එකී පනතේ 136 වැනි වගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව 2010 වර්ෂයේ අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ජී. කපිල,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

05-573/4

---

**මාතර මහ නගර සභාව**

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ ගන්දර සිරි සරණතිස්ස මාවත නම් කිරීම

2008.12.02 දින පැවැති මාසික සභා රැස්වීමේ දී අංක 06:2 සභා සම්මුතිය අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

(252 වැනි අධිකාරය වන ) මහ නගර සභා ආඥාපනත 71(1) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර

පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත "ගන්දර සිරි සරණතිස්ස මාවත" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආර්. කේ. ආර්. ආර්. රණවීර,
නාගරික කොමසාරිස්,
මාතර.

2010 මාර්තු මස 10 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | :- | මාතර මහ නගර සභාව |
| 2. | දිස්ත්‍රික්කය | :- | මාතර |
| 3. | වීථියේ වර්තමාන නම | :- | තොටුපල පාර |
| 4. | අලුතින් යොදා ඇති නම | :- | ගන්දර සිරි සරණතිස්ස මාවත |
| 5. | මාර්ග විස්තරය | :- | ශ්‍රී ආනන්දරාම මාවතින් ආරම්භ වී මුහුදු වෙරළ දක්වා |

05-547/2

---

**මාතර මහ නගර සභාව**

**1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ A.C.M. අකිල් මාවත ලෙස නම් කිරීම.**

2008.01.10 වැනි දින පැවති මහ නගර සභාවේ අංක 07:3 දරන සභා සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

(252 වැනි අධිකාරය වන ) මහ නගර සභා ආඥාපනත 71(1) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත ඒ. සී. එම්. අකිල් මාවත යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආර්. කේ. ආර්. ආර්. රණවීර,
මාතර නාගරික කොමසාරිස්.

2010 මාර්තු මස 10 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | :- | මාතර මහ නගර සභාව |
| 2. | දිස්ත්‍රික්කය | :- | මාතර |
| 3. | වීථියේ වර්තමාන නම | :- | දුම්රිය පොල පිවිසුම් පාර |
| 4. | අලුතින් යොදා ඇති නම | :- | ඒ. සී. එම්. අකිල් මාවත |
| 5. | මාර්ග විස්තරය | :- | මාතර ප්‍රධාන දුම්රිය පොළ අසලින් ආරම්භ වී බතුතා පාර දක්වා |

05-547/1

---

**මහනුවර මහ නගර සභාව**

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ "ලුතිතන් කොමාන්ඩර් සමන්සිරි රාජපක්ෂ මාවත" ලෙස නම් කිරීම.

2009.10.26 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ දී අංක 8 (61) දරන සභා සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී :

(252 වැනි අධිකාරය වන ) මහ නගර සභා ආඥාපනත 71(1) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි මධ්‍යම පළාත් සභාවේ මහ ඇමතිතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත "ලුතිතන් කමාන්ඩර් සමන්සිරි රාජපක්ෂ මාවත" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
නාගරික කොමසාරිස්,
මහනුවර.

2010 මැයි මස 03 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | :- | මහනුවර මහ නගර සභාව |
| 2. | දිස්ත්‍රික්කය | :- | මහනුවර |
| 3. | වීථියේ වර්තමාන නම | :- | ධර්මාශෝක මාවතේ 1 පටුමග |
| 4. | අලුතින් යොදා ඇති නම | :- | "ලුතිතන් කොමාන්ඩර් සමන්සිරි රාජපක්ෂ මාවත" |
| 5. | මාර්ග විස්තරය | :- | අරුප්පල ලේන් 11 අංක 35/17 දරන ස්ථානයෙන් ආරම්භ වී ධර්මාශෝක මාවත 1 වන පටුමග අංක 47 දරන ස්ථානයෙන් අවසන් වන මාර්ග කොටස වේ. |

05-496

---

## මහනුවර මහ නගර සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ "අතිපූජ්‍ය දුනුකේවිල ආනන්දතිස්ස නා හිමි මාවත" ලෙස නම් කිරීම.

2009.10.26 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ දී අංක 8 (62) දරන සභා සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

(252 වැනි අධිකාරිය වන ) මහ නගර සභා ආඥා පනතේ 71(1) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි මධ්‍යම පළාත් සභාවේ ඇමතිතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත අතිපූජ්‍ය දුනුකේවිල ආනන්දතිස්ස නා හිමි මාවත යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
මහනුවර නාගරික කොමසාරිස්,
මහනුවර.

2010 මැයි මස 03 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | :- | මහනුවර මහ නගර සභාව |
| 2. | දිස්ත්‍රික්කය | :- | මහනුවර |
| 3. | වීථියේ වර්තමාන නම | :- | අදාල මාර්ගයේ පිහිටි දේපල වටගොඩ පන්සල පාරෙන් වරිපනම් අංක ලබාදී ඇත |
| 4. | අලුතින් යොදා ඇති නම | :- | "අතිපූජ්‍ය දුනුකේවිල ආනන්දතිස්ස නා හිමි මාවත" |
| 5. | මාර්ග විස්තරය | :- | වාගොල්ල පාර අංක 10 වටගොඩ පන්සල පාර ස්ථානයෙන් ආරම්භ වී වටගොඩ පන්සල පාර අංක 57/24 දරන ස්ථානයෙන් අවසන් වන මාර්ග කොටස වේ. |

05-497

---

## අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24 (2) වැනි වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ආර්. ගාමණී සනත් බණ්ඩාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව, අරණායක.

2010 අප්‍රේල් මස 26 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | අට්ටාපිටිය පාලම ලඟ සිට කෝන්ගහකැලේ වත්ත කට්ටි අංක 79 දක්වා |
| මාර්ගයේ ආරම්භය හා අවසානය | :- | අට්ටාපිටිය හිඟුල මාර්ගයේ අට්ටාපිටිය පාලම අසලින් ආරම්භව කට්ටි අංක 1,2,32,33,35,36,37,77,76,78,79,74 දක්වා |
| ග්‍රාම සේවක වසම | :- | අට්ටාපිටිය |
| මාර්ගයේ දිග | :- | මීටර් 650 |
| මාර්ගයේ පළල | :- | පාලම අසල සිට අංක 1 දරන ඉඩම් කට්ටිය දක්වා පළල අඩි 30 හා අංක 1 සිට අංක 79 දක්වා පළල අඩි 20 |
| මාර්ගයේ ආරම්භය හා අවසානය දක්වා වම්පස සහ දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම | :- | එල්. ඒ. පී. සෙනෙවිරත්න මයා, කෝන්ගහකැලේවත්ත |
| විමපස ලොට් අංක | :- | 1,34,33,77,78,79 |
| දකුණුපස ලොට් අංක | :- | 33,36,37 |

බලයලත් මිනින්දෝරු එම්. ඩී. සෙනෙවිරත්න මහතාගේ පිඹුරු අංක 635 හා 2004 අගෝස්තු මස 11 දිනැති පිඹුරුපත පරිදි හා බලයලත් මිනින්දෝරු ඒ. ඩී. සෙනෙවිරත්න මහතාගේ පිඹුරු අංක 1568 හා 2004 නොවැම්බර් සිට 2005 ජනවාරි තෙක් මැනුම් කටයුතු කල පිඹුරුපත පරිදියි.

05-379

---

## කන්තලේ ප්‍රාදේශීය සභාව

**ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)**

2010 වසරට අදාලව මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ ඉදිරියෙන් සඳහන්ව ඇති ස්ථානයේ මස් පිණිස ගවයින් මැරීමට හා මස් විකිණීම සඳහා ඉල්ලුම් කර ඇති බැවින්, මෙම බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් කන්තලේ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විසින් තම විරුද්ධත්වයට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 14 ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) අංක 07(2) දරන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. බී. එම්. ෆාරුක්,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2010 අප්‍රේල් මස 22 වැනි දින,
ප්‍රාදේශීය සභාව, කන්තලේ.

උපලේඛනය

| | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *වෙළඳාමේ ස්වභාවය ලබන ස්ථානය* | *වෙළඳාම් කරන ස්ථානය* | *ගවයින් ඝාතනය කරන ස්ථානය* |
|---|---|---|---|---|
| 01. | අයි. එෆ්. ඒ. ගපූර් මයා 59/1, ලීලාරත්න මාවත කන්තලේ. | එළ හරක් මස් | කන්තලේ පේරාරු අල්තාරික් විදුහල අසල මස් කඩය | නගර සභා මාවත, පෝටන් කොටුව, කන්තලේ |
| 02. | ඒ. එෆ්. දාවුස්බාන් මයා 235/4, මජිඩ් මාවත කන්තලේ | එළ හරක් මස් | කන්තලේ පේරාරු මුස්ලිම් පල්ලිය අසල මස් කඩය | නගර සභා මාවත, පෝටන් කාටුව, කන්තලේ |
| 03. | කේ. මර්ලියා මිය 01, ලීලාරත්න මාවත, කන්තලේ | එළ හරක් මස් | කන්තලේ පොදු වෙළඳ පොල මස්කඩය | නගර සභා මාවත, පෝටන් කාටුව, කන්තලේ. |

05-378

# විවිධ දැන්වීම්

## පෑලියගොඩ නගර සභාව

### 2010 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

පෑලියගොඩ නගර සභාව විසින් 2009 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 4-5 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත වී ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ යෝජනාවේ දැක්වෙන කිසියම් කාර්යයක් සඳහා ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට 2010 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ඒ යෝජනාවේ සඳහන් අදාල ගාස්තුව පෑලියගොඩ නගර සභාව වෙත ගෙවිය යුතු බවටත් මෙයින් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එකී බලපත්‍ර ගාස්තු ගෙවීම චෙක්පත් මගින් සිදු කරන්නේ නම් එම ගාස්තු ගෙවූ දිනය වශයෙන් සලකනු ලබන්නේ චෙක්පත උපලබ්ධි වූ දිනය බව වැඩිදුරටත් නිවේදනය කරමි.

ඩී. නිහාල් ආනන්ද පෙරේරා,
සභාපති,
පෑලියගොඩ නගර සභාව.

2009 ඔක්තෝබර් මස 01 වැනි දින,
පෑලියගොඩ නගර සභාව,
පෑලියගොඩ.

*උපලේඛනය*

4-5 ගරු සභාපති ඩී. නිහාල් ආනන්ද පෙරේරා මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් සාදන ලද හා පෑලියගොඩ නගර සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා වැළඳගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීම සඳහා පෑලියගොඩ නගර සභාව විසින් 2010 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත 255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 162 වැනි වගන්තිය සමග කියවිය යුතු 164 වන වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත වගුවේ 02 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වෙනුවෙන්, ඒ එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම තුන්වන, හතරවන හෝ පස්වන තීරුවලින් දැක්වෙන වාර්ෂික වටිනාකම සැසඳෙන තීරුවේ එකී වගුවේ ඒ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය සඳහන් පේලිය ඉදිරියේ දැක්වෙන මුදල් ප්‍රමාණයට සමාන ප්‍රමාණයක ගාස්තුවක් නියම කිරීමට පෑලියගොඩ නගර සභාව යෝජනා කරන්නීය.

| *අනු අංකය* | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන විට* | *රු.750ට වැඩි 1,500 නොඉක්මවන විට* | *රු.1,500 ඉක්මවන විට* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | තේ කඩයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 02. | බේකරියක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 03. | හෝටලයක් පවත්වාගෙන යාම (ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නොකල) | 500 | 750 | 1,000 |
| 04. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 05. | සිසිල්බීම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 06. | අයිස් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 07. | මාලු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 08. | සංචාරක නවාතැන් පලක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 09. | ආගන්තුක නිවාසයක් (ගෙස්ට් හවුස්) පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 10. | බැටලුවන්, ඌරන් හෝ එළුවන් 10කට වඩා ඇති මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 11. | කිකිළියන් එක සියයකට වැඩි ගණනක් සඳහා මඩුවක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 12. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |

05-452/5

**පැලියගොඩ නගර සභාව**

**2010 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම**

පැලියගොඩ නගර සභාව විසින් 2009 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 4-4 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත වී ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2010 වර්ෂය සඳහා පනවන ලද ඉහත කී ව්‍යාපාර බද්ද, 2010 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නගර සභා කාර්යාලයට ගෙවනු ලැබිය යුතු බවත් මෙයින් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එකී ව්‍යාපාර බද්ද ගෙවීම චෙක්පත් මගින් සිදුකරන්නේ නම් ඒ බද්ද ගෙවූ දිනය වශයෙන් සලකනු ලබන්නේ චෙක්පත උපලබ්ධි වූ දිනය බව තවදුරටත් නිවේදනය කරමි.

ඩී. නිහාල් ආනන්ද පෙරේරා,
සභාපති,
පැලියගොඩ නගර සභාව.

2009 ඔක්තෝබර් මස 01 වැනි දින,
පැලියගොඩ නගර සභාව,
පැලියගොඩ.

උපලේඛනය

4-4 ගරු සභාපති ඩී. නිහාල් ආනන්ද පෙරේරා මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165ආ වන වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුලත කරගෙන යනු ලබන පහත වගුවේ දෙවන තීරුවේ සඳහන් එක් එක් වෙළඳාම හෝ ව්‍යාපාරය වෙනුවෙන් මේ බද්ද බල පැවැත්වෙන වර්ෂයට පෙරාතුවම වූ වර්ෂයේ ඒ එක් එක් වෙළඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණයෙන්, 3 වැනි තීරුවේ සිට 08 වන තීරුව දක්වා වන තීරුවලින් ඒ ඒ ලැබීම් ප්‍රමාණයට ගැලපෙන තීරුවේ එකී වගුවේ ඒ වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය සඳහන් පේළිය ඉදිරියේ දැක්වෙන මුදල් ප්‍රමාණයට සමාන ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2010 වර්ෂය සඳහා පැනවීමටත් එකී ව්‍යාපාර බද්ද 2010 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පැලියගොඩ නගර සභාවට ගෙවිය යුතු බවට විධානය කිරීමටත් තීරණය කල යුතු යැයි පැලියගොඩ නගර සභාව යෝජනා කරන්නීය.

වගුව

| | | *ගතවූ වර්ෂයේ දී වෙළඳ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් රුපියල්* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| *අනු අංකය* | *වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *6,000 හෝ ඊට අඩු* | *6,000 ට වැඩි නමුත් 12,000 හෝ ඊට අඩු* | *12,000 ට වැඩි නමුත් 18,750 හෝ ඊට අඩු* | *18,750 ට වැඩි නමුත් 75,000 හෝ ඊට අඩු* | *75,000 ට වැඩි නමුත් 1,50,000 හෝ ඊට අඩු* | *1,50,000 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | සිසිල්බීම ගබඩාකර තබා ගැනීම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 02. | ගැලුම් 50කට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩාකර තබා ගැනීම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 03. | දැව ගබඩාවක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 04. | දර ගබඩා කිරීම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 05. | යන්ත්‍රෝපකරණ පාවිච්චිකරන කම්හලක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 06. | බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 07. | හිස්ගෝනි ගබඩාකර තබා ගැනීම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 08. | රබර් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 09. | නරක්වනසුලු ආහාර ද්‍රව්‍ය මෙට්‍රික් ටොන් එකකට වඩා ගබඩාකර තබා ගැනීම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 10. | දුම්කොළ ගබඩා කිරීමේ හෝ සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 11. | කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 50කට වැඩි ප්‍රමාණයක් වෙළඳාම් පිණිස ගබඩාකර තබා ගැනීම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 12. | සත්ත්ව ආහාර ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |

| අනු අංකය | වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | ගතවූ වර්ෂයේ දී වෙළඳ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් රුපියල් | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 6,000 හෝ ඊට අඩු | 6,000 ට වැඩි නමුත් 12,000 හෝ ඊට අඩු | 12,000 ට වැඩි නමුත් 18,750 හෝ ඊට අඩු | 18,750 ට වැඩි නමුත් 75,000 හෝ ඊට අඩු | 75,000 ට වැඩි නමුත් 1,50,000 හෝ ඊට අඩු | 1,50,000 ට වැඩි |
| | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 13. | පරණ ලෝහ ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 14. | පුන්නක්කු මෙට්‍රික් ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 15. | හුණු ගබඩාවක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 16. | පින්තාරු තීන්ත, වාර්නිස් හෝ ඩිස්ටැම්පර් සියම් කිලෝ ග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 17. | ටයර්, ටියුබ්, වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 18. | ශීතකළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 19. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 20. | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 21. | ඩ්‍රයික්ලීන් කරන හෝ ඇඳුම් පිරිසිදු කරන (ලොන්ඩ්‍රියක්) ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 22. | මෝටර් රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
| 23. | ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | - | 90 | 180 | 360 | 1,200 | 3,000 |
